SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	ගෘහ ආර්ථික විද්‍යාව	පත්‍රය வினாத்தாள் **Paper**	**I**	කාලය காலம் **Time**	පැය 01

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✕) ලකුණ යොදන්න.

(iv) **I** ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු **II** පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

(01) ආහාරවල අඩංගු ප්‍රෝටීන, ජීර්ණයෙන් පසු සිරුරට අවශෝෂණය කර ගනු ලබන ආකාරය වනුයේ,

(1) ග්ලූකෝස් ලෙස ය. (2) ඇමයිනෝ අම්ල ලෙස ය.
(3) මේද අම්ල ලෙස ය. (4) ග්ලිසරෝල් ලෙස ය.

(02) මාෂ බෝග වර්ග දෙකක් වනුයේ,

(1) කඩල සහ කුරක්කන් ය. (2) මෙනේරි සහ සහල් ය.
(3) මුං ඇට සහ කව්පි ය. (4) තල සහ තිරිඟු ය.

(03) ඒක අසංතෘප්ත මේද අම්ලයකට උදාහරණයකි,

(1) ලෝරික් අම්ලය (2) මිරිස්ටික් අම්ලය
(3) ඇරකිඩොනික් අම්ලය (4) ඔලෙයික් අම්ලය

(04) එක්තරා පුද්ගලයකුගේ කිසියම් ඌනතාවයකට අදාළව පහත සඳහන් රෝග ලක්ෂණ දක්නට ලැබුණි.

- වීදුරුමස් ඉදිමීම
- දත් බුරුල් වීම
- තුවාල සුවවීම ප්‍රමාද වීම
- වීදුරුමසින් ලේ ගැලීම

මෙම පුද්ගලයාගේ ඌනතා තත්ත්වයට අදාළ පෝෂකය වනුයේ,

(1) ඇස්කෝබික් අම්ලය ය. (2) ෆෝලික් අම්ලය ය.
(3) පැන්ටොතනික් අම්ලය ය. (4) නිකොටිනික් අම්ලය ය.

(05) සිරුරේ ජල තුලනය හා අම්ල භෂ්ම තුලනය පවත්වා ගැනීම කෙරෙහි බලපාන ඛනිජ වර්ගයකි,

(1) මැග්නීසියම් (2) අයඩින් (3) කැල්සියම් (4) පොටෑසියම්

(06) මෝල්ටෝස් අඩංගු ආහාර ප්‍රභව දෙකකි,

(1) උක් සීනි සහ බීට් සීනි (2) මී පැණි සහ කිතුල් පැණි
(3) බාර්ලි සහ තිරිඟු (4) මිදි සහ බෙලි

For Educational Purpose Only

SLGURU.LK

(07) පෝෂණ වගුව ලෙස හැඳින්වෙන්නේ,
(1) ආහාර වේලට දෛනිකව ඇතුළත් කළ යුතු ආහාර ප්‍රමාණ දැක්වෙන සටහනයි.
(2) පරිභෝජනයට ගන්නා නොපිසූ, එක් එක් ආහාර ද්‍රව්‍යවල ග්‍රෑම් 100ක / මි. ලි. 100ක අඩංගු පෝෂක ප්‍රමාණ දැක්වෙන සටහනයි.
(3) පුද්ගලයින් දෛනිකව ලබා ගත යුතු පෝෂක ප්‍රමාණ දැක්වෙන සටහනයි.
(4) ආහාර වේල් සැලසුම් කිරීමේ දී යොදා ගන්නා ආහාර කාණ්ඩ පිළිබඳ සටහනයි.

(08) අපරදිග ක්‍රමයට අනුව, ආහාර පිළිගන්වන මේසය මත තැබීමට වඩාත් සුදුසු මල් සැකසුමකි,
(1) උසින් වැඩි බඳුනක සැකසූ මල් සැකසුම
(2) කෘත්‍රිම මල්වලින් හා ස්වාභාවික කොළවලින් කරන ලද සැකසුම
(3) සුවඳ නොවිහිදෙන මල් යෙදූ සාමූහික සැකසුම
(4) වර්ණ කිහිපයකින් යුත්, සුවඳ හමන මල් පමණක් යෙදූ සැකසුම

(09) ආහාර ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් වනුයේ,
(1) ශීතකරණ තුළ පමණක් ගබඩා කර ඇති මස් හා මාළු මිලදී ගැනීම ය.
(2) පළතුරුවල වර්ණය, පොත්ත මත ඒකාකාරීව පැතිරී පැවතීම ය.
(3) කල්තබා ගත හැකි එළවළු වර්ග පමණක් මිලදී ගැනීම ය.
(4) සකස් කළ ආහාර ද්‍රව්‍ය සඳහා ප්‍රමිති සහතිකය තිබීම ය.

(10) ආහාර ගබඩා කර තැබීමේ දී, ඒවායේ ගුණාත්මක ලක්ෂණ කෙරෙහි බලපාන එක් සාධකයක් වනුයේ ආර්ද්‍රතාවය යි. මෙයින් අදහස් කෙරෙනුයේ,
(1) වාතයේ අඩංගු ජල වාෂ්ප ප්‍රමාණය යි.
(2) අවට පරිසරයේ ඇති උෂ්ණත්වය යි.
(3) ආහාරයක් ඔක්සිජන් සමඟ ප්‍රතික්‍රියා කිරීම නිසා සිදුවන වෙනස යි.
(4) ආහාරයේ අඩංගු පෝෂක මත එහි එන්සයිම ක්‍රියා කිරීම යි.

(11) ආහාර වර්ග සකස් කිරීමේ දී, පිපුම් කාරකයක් ලෙස යොදා ගත හැකි රසායනික සංයෝගයකි,
(1) සෝඩියම් ක්ලෝරයිඩ්.
(2) සෝඩියම් බයිකාබනේට්.
(3) සෝඩියම් බෙන්සොඒට්.
(4) සෝඩියම් නයිට්‍රයිට්.

(12) සියලු ම ක්ෂුද්‍රජීවී සෛල මෙන්ම, බීජාණු ද විනාශ වන ආහාර පරිරක්ෂණ ක්‍රමයක් වනුයේ,
(1) ජීවාණුහරණය යි.
(2) ජාඩි දැමීම යි.
(3) ලුණු දෙහි සෑදීම යි.
(4) පැස්චරීකරණය යි.

(13) ආහාර ජීර්ණ ක්‍රියාලියට අදාළව, ආමාශය තුළ දී ආහාර මිශ්‍ර වී, තලපයක් බඳු තත්ත්වයකට පත්වේ. මෙම තත්ත්වය,
(1) තෙලෝදකරණය යි.
(2) අවශෝෂණ ක්‍රියාවලිය යි.
(3) ක්‍රමාකුංචනය යි.
(4) ආමලසය යි.

(14) ලිපිඩ ජීර්ණය කෙරෙහි බලපාන එන්සයිමයක් වනුයේ,
(1) ඇමයිලේස් ය.
(2) මෝල්ටේස් ය.
(3) පෙප්ටයිඩේස් ය.
(4) ලයිපේස් ය.

For Educational Purpose Only

(15) පහත දැක්වෙන ප්‍රකාශ අතරින්, විශේෂ පෝෂණ අවශ්‍යතා ඇති අවධි හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ළදරුවාගේ පළමු මාස හයේ දී, ඛනිජ අවශ්‍යතාවය සපුරාලනු ලබන්නේ අතිරේක ආහාර දීම මගිනි.

(2) ගර්භණී මවකගේ දෙවන හා තෙවන ත්‍රෛමාසිකයන්හි දී දෛනික ෆෝලික් අම්ල අවශ්‍යතාව මයික්‍රෝ ග්‍රෑම් 600ක් පමණ වේ.

(3) යෞවන අවධියේ අස්ථි වර්ධනය වීම හා අස්ථි ඝනත්වය වැඩිවීම සඳහා සල්ෆර් අවශ්‍යතාවය වැඩි වේ.

(4) ක්ෂීරණ මවකගේ පළමු මාස හය තුළ දී, ප්‍රෝටීන් අවශ්‍යතාවය ග්‍රෑම් 40කින් වැඩි වේ.

(16) පහත දැක්වෙනුයේ ''X'' නමැති පෝෂණ ගැටලුවකට අදාළ රෝගී තත්ත්වයක් හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

- රුධිරයේ අඩංගු ඇල්බියුමින් හා හිමොග්ලොබින් ප්‍රමාණය අඩුවේ.
- අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල ශරීරයට නිසි ප්‍රමාණයට නොලැබීමෙන් හට ගනී.
- හිසකෙස් තඹ පැහැති වී, පහසුවෙන් කැඩී යයි.
- අත්, පා, උදරයේ ඉදිමුම ඇතිවේ.

ඉහත ප්‍රකාශවලට අදාළ රෝගය වනුයේ,

(1) තමස් අන්ධතාවය ය. (2) නීරක්තිය ය.

(3) ගලගණ්ඩය ය. (4) ක්වොෂියෝර්කෝර් ය.

(17) දරුවකුගේ සෑම වයස් මට්ටමක දීම, වයසට සරිලන උස නොමැති වීමෙන් ඇතිවන මන්දපෝෂණ තත්ත්වයකි,

(1) තීව්‍ර මන්දපෝෂණය

(2) මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය

(3) කාලීන මන්දපෝෂණය

(4) උග්‍ර තීව්‍ර මන්දපෝෂණය

(18) ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ විවිධ කොටස්වලින් කෙරෙන කාර්යයන් අනුව නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ගර්භාෂය - ඩිම්බ පරිවහනය

(2) ඩිම්බ කෝෂ - පරිණත ඩිම්බ මුදා හැරීම

(3) පැලෝපීය නාලය - ස්ත්‍රී ප්‍රජනක හෝමෝන නිෂ්පාදනය

(4) ගර්භාෂ කුහරය - ඩිම්බ පරිණත වීම

(19) ගර්භණී අවධියේ අවදානම් සාධකයක් **නොවන්නේ,**

(1) අධි රුධිර පීඩනය යි. (2) සමාජ රෝග යි.

(3) ඇදුම රෝගය යි. (4) පාද ඉදිමීම යි.

(20) උපතේ දීම ගැහැණු දරුවකුගේ ඩිම්බ කෝෂ තුළ ප්‍රාථමික ඩිම්බ සෛල නිෂ්පාදනය වී ඇත. මේවා පවතින්නේ,

(1) සයුනිකා නමැති ව්‍යූහ තුළ ය.

(2) ගර්භාෂය තුළ ය.

(3) ගර්භාෂ බිත්තිය ආසන්නයේ ය.

(4) පැලෝපීය නාලය තුළ ය.

For Educational Purpose Only

(21) දරුවකුගේ සංවර්ධනයට බලපාන්නා වූ වැදගත් සාධයක් වන ආරමය ගුණාංග තීරණය වනුයේ,
(1) මවගෙන් හා පියාගෙන් උරුමවන ජාන මගිනි.
(2) මවගේ ජාන මගිනි.
(3) පියාගේ ජාන මගිනි.
(4) මවගේ පරම්පරාවේ ජාන මගිනි.

(22) ළදරු මොළය වර්ධනයට වැදගත්වන, මාකිරිවල අඩංගු DHA ලෙස හැඳින්වෙන්නේ,
(1) අත්‍යවශ්‍ය නොවන ඇමයිනෝ අම්ලයකි.
(2) මාකිරිවල අඩංගු සීනි විශේෂයකි.
(3) විටමින් වර්ග කිහිපයකි.
(4) අත්‍යවශ්‍ය මේද අම්ලයකි.

(23) ළදරුවකු අතිරේක ආහාරවලට හුරු කිරීමේ දී වැදගත් **නොවන** කරුණකි,
(1) කුඩා ප්‍රමාණවලින් ආහාර දීම ආරම්භ කිරීම.
(2) ලුණු සහ සීනි එකතු කිරීම.
(3) විවිධත්වයෙන් යුත් ආහාර වර්ග ලබා දීම.
(4) ළදරුවාට මාස හය සම්පූර්ණ වූ පසු අතිරේක ආහාර දීම ආරම්භ කිරීම.

(24) මුල් ළමා වියේ දී පෙන්වන ''කෝපාවේගය'' ළමා වියට එළඹෙත්ම,
(1) තව දුරටත් වර්ධනය වේ.
(2) ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වේ.
(3) ක්‍රමයෙන් අඩු වී යයි.
(4) පාලනය කර ගැනීම අපහසු වේ.

(25) දරුවකුගේ මානසික වර්ධනය තුළින් සිදුවන්නකි,
(1) නිරවුල් අදහස් ප්‍රකාශ කිරීමට අසමත් වීම.
(2) ළමා ස්වරූපය වෙනස් වී, වැඩිහිටි ස්වරූපයක් ගැනීම.
(3) විවිධ අක්‍රමතා මෙන්ම ගැටලුවලට මුහුණදීමට සිදු වීම.
(4) තමා අවට වෙනස්වන පරිසරයට පහසුවෙන් අනුගත වීමේ හැකියාව ඇති වීම.

(26) යොවුන් වියේ දරුවන් තුළ ඇතිවන, චිත්තවේග පිළිබඳ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) සතුට, තෘප්තිමත් බව වැනි ප්‍රසන්න භාවික පමණක් ඇතිවේ.
(2) චිත්තවේග ප්‍රකාශනයේ දී ආවේගශීලී හැසිරීම් රටා පිළිඹිබු කරයි.
(3) චිත්තවේග මැනෙවින් පාලනය කර ගනියි.
(4) චිත්තවේග තීව්‍ර ලෙස ඇති නොවේ.

(27) ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට අනුව, ATD එන්නත මගින් වළක්වන රෝග තත්ත්ව දෙකකි,
(1) පිටගැස්ම සහ ගලපටලය
(2) කක්කල් කැස්ස සහ සරම්ප
(3) පෝලියෝ සහ ජර්මන් සරම්ප
(4) ක්ෂය රෝගය සහ කම්මුල්ගාය

For Educational Purpose Only

(28) නිවසක භාවිත කෙරෙන ගෘහ පිළිවලට උදාහරණ කිහිපයක් වනුයේ,
(1) ලේන්සු, මේස් සහ තිර රෙදි ය.
(2) කුෂන් කවර, තුවා සහ යට ඇඳුම් ය.
(3) ඇඳ ඇතිරිලි, කොට්ට උර සහ මේස ඇතිරිලි ය.
(4) බිත්ති සැරසිලි, ළදරු ඇඳුම් සහ අත් පිස්නා ය.

(29) මෝස්තරයක යම් හැඩතලයක් සම්පූර්ණයෙන් ම පිරවීමට යොදා ගත හැකි වඩාත් ගැළපෙන මැහුම් ක්‍රමයකි,
(1) ලේසි ඩේසි මැස්ම (2) දිග කොට මැස්ම
(3) හුරුළු කටු මැස්ම (4) පිහාටු මැස්ම

(30) කුෂන් කවරයක් මැසීම සඳහා යොදා ගන්නා මූට්ටු වර්ග වනුයේ,
(1) පැතලි මූට්ටුව හා සරල මූට්ටුව ය. (2) චාම් මූට්ටුව හා අතිශාදන මූට්ටුව ය.
(3) ප්‍රංශ මූට්ටුව හා විවෘත පැතලි මූට්ටුවය. (4) සරල මූට්ටුව හා ප්‍රංශ මූට්ටුව ය.

(31) බන්දේසි කවරයක් මැසීම සඳහා සුදුසු රෙදි වර්ග දෙකකි,
(1) කේස්මන්ට් සහ අමු රෙදි (2) රෙප් සහ නයිලෝන් රෙදි
(3) තුනී පොප්ලීන් සහ ටෙරලින් රෙදි (4) විස්කෝස් සහ වොයිල් රෙදි

(32) පහත දැක්වෙන ගුණාංග අතරින්, කපු රෙදි හඳුනා ගැනීම සඳහා අතගා බැලීමෙන් නිරීක්ෂණය කළ හැකි ගුණාංග නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.
(1) රළු බවක්, උණුසුම් බවක් හා ඇදෙන සුළු බවක් ඇත.
(2) සිසිල් බවක්, උණුසුම් බවක් හා අතට බර බවක් ඇත.
(3) මෘදු බවක්, සිසිල් බවක් හා නොඇදෙන සුළු බවක් ඇත.
(4) සැහැල්ලු බවක්, උණුසුම් බවක් හා රළු බවක් ඇත.

(33) සිසුවකු විසින්, පතරොමක් නිර්මාණයේ දී, අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් පිළිබඳව, පහත පරිදි අදහස් දක්වා තිබුණි.
A - පතරොමේ කවාකාර ස්ථානවල මිමි සටහන් කිරීමේ දී මිනුම් පටිය වක්‍රව තැබීම.
B - නිර්මාණ රේඛා හා දක්කු රේඛා එකම වර්ණයකින් ඇඳීම.
C - පතරොමේ සරල රේඛා ඇඳීම සඳහා කෝදුව භාවිත කළ යුතු වීම.
D - දුඹුරු කඩදාසියේ ඔපය සහිත පෘෂ්ඨය භාවිත කිරීම.
E - දුඹුරු කඩදාසියේ සිරස් රේඛා පිහිටන දිශාවට, පතරොමේ දිගත් රේඛාව ගැනීම.
ඉහත කරුණු අතරින් නිවැරදි වනුයේ,
(1) A, B සහ D ය. (2) C, B සහ D ය.
(3) A, B සහ C ය. (4) A, C හා E ය.

(34) රෙදි පිරියම් කිරීමේ ක්‍රමයක් වනුයේ,
(1) රෙද්දේ හරස් නූලක් ඇද, ඒ ඔස්සේ ඇදීම.
(2) දළ බව ඉවත් කිරීමට සේදීම.
(3) රෙද්දේ ඇද ඉවත් කිරීමට දික් නූලක් ඉවත් කර, ඒ ඔස්සේ කැපීම.
(4) ඉලිප්පී ඇති නූල් කැබලි ඉටිපන්දමකින් සීරුවෙන් පිළිස්සීම.

For Educational Purpose Only

(35) පතරොම තබා රෙදි කැපීමේ දී, අවධානය යොමු කළ යුතු කරුණක් වනුයේ,
(1) රෙද්දේ දිගත් රේඛාවට, පතරොම් කොටස් හරස් අතට තැබීම ය.
(2) රෙද්දේ නොපිට මත පතරොම් කොටස් ඇතිරීම ය.
(3) රෙදි පිරිමැසෙන සේ පළමුව විශාල කොටස් අතුරා, පසුව කුඩා කොටස් ඇතිරීම ය.
(4) පළමුව පතරොමේ කුඩා කොටස් අතුරා, පසුව විශාල කොටස් ඇතිරීම ය.

(36) නිවාස සැලසුම් ඇඳීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් වනුයේ,
(1) පරිමාණය හා සංකේත ය.
(2) හැඩතල හා පරිමාණය ය.
(3) සංකේත හා රේඛා ය.
(4) හැඩතල හා බිම් සැලැස්ම ය.

(37) නිවසක ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගැනීම සඳහා භාවිත කළ හැකි අනුයෝගී ක්‍රමයකි,
(1) දොර ජනෙල් යෙදීම
(2) මැද මිදුලක් සෑදීම
(3) වා කවුළු යෙදීම
(4) උස් වූ වහලක් යෙදීම

(38) ගෘහීය සම්පත් අතරින් ප්‍රජා පහසුකම් යටතට ගැනෙන සම්පත් දෙකක් වනුයේ,
(1) පෞද්ගලික පාසල් හා රෝහල් ය.
(2) ක්‍රීඩා පිට්ටනි හා මුදල් ය.
(3) ජලය හා ප්‍රවාහන සේවා ය.
(4) පුස්තකාල හා රජයේ පාසල් ය.

(39) පවුල තුළ ඇතිවන කිසියම් ගැටලුවක් විසඳීමේ දී එහි මූලික පියවර විය යුත්තේ,
(1) ගැටලුවට අදාළ කරුණු රැස් කිරීම ය.
(2) විසඳීමේ ක්‍රියා මාර්ග හඳුනා ගැනීම ය.
(3) ගැටලුව හඳුනා ගැනීම ය.
(4) ගැටලුව විශ්ලේෂණය කිරීම ය.

(40) මේ අතරින් නිවැරදි අන්තර් මාධ්‍යමික වර්ණ කාණ්ඩය තෝරන්න.
(1) නිල් + දම් → නිල් දම් ය.
(2) කහ + රතු → කහ රතු ය.
(3) කොළ + තැඹිලි → කොළ තැඹිලි ය.
(4) රතු + නිල් → රතු නිල් ය.

For Educational Purpose Only

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	විෂයය / பாடம் / Subject	පත්‍රය / வினாத்தாள் / Paper	කාලය / காலம் / Time
11	ගෘහ ආර්ථික විද්‍යාව	II	පැය 02

සැලකිය යුතුයි:

- **පළමු ප්‍රශ්නය** හා **තවත් ප්‍රශ්න හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් ඡේදය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ළදරු හා මුල් ළමා වියෙහි පසුවන දරු දෙදෙනෙකුගෙන් සමන්විත පවුලක පියා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකි. මව තම නිවසේම දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යයි. නිවස සහ ගෙවත්ත පිරිසිදුව හා අලංකාරව පවත්වා ගැනීමට ඔවුහු දැඩි කැමැත්තක් දක්වති. පවුලේ ආහාර වේල් සැලසුම් කිරීමේ දී ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීමට මව නිතරම උත්සාහ දරයි.

(i) ගෙවතු අලංකරණයේ නියැලීමෙන් අත්වන වාසි හතරක් ලියන්න.

(ii) නිවස තුළ, අවධාරණය ඇති කර ගැනීම සඳහා යොදා ගත හැකි උපාංග හතරක් ලියන්න.

(iii) ගෘහ කාර්යයන්හි සාර්ථක්වය සඳහා මෙම පවුලේ කටයුතු මැනවින් කළමනාකරණය කර ගත යුතු වේ. කළමනාකරණ ක්‍රියාවලිය අර්ථ දක්වන්න.

(iv) ළදරුවාගේ පෝෂණය පිළිබඳව වැදගත්වන කරුණු දෙකක් දක්වන්න.

(v) මුල් ළමා වියේ දරුවකු සඳහා ආහාර වේල් සැලසුම් කිරීමේ දී, අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් ලියන්න.

(vi) ළදරුවා සඳහා ලබා දිය හැකි අර්ධ ඝන ආහාර වර්ග දෙකක් නම් කරන්න.

(vii) වැඩිමහල් දියණිය සඳහා මසන ගවුමක් නිර්මාණය කිරීමේ දී, අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් දක්වන්න.

(viii) එම ගවුම මැසීම සඳහා රෙදි තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් ලියන්න.

(ix) දිවා සුරැකුම් මධ්‍යස්ථානයක පාලිකාවක සතුවිය යුතු ගුණාංග හතරක් ලියන්න.

(x) පියාගේ රැකියාව මෙම පවුලේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බලපාන්නේ කෙසේ දැයි කරුණු දෙකකින් දක්වන්න. (ලකුණු 2 x 10 = 20)

(02) (i) නිවසේ භාවිත වන ගෘහ පිළිවලට උදාහරණ තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) කුෂන් කවරයක විවරය පියවීම සඳහා, යොදා ගත හැකි ක්‍රම තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) ළමා ගවුමේ සාය කොටස මැසීම සඳහා අවශ්‍ය රෙදි ප්‍රමාණය සඳහන් කර, ඒ සඳහා තබන මැහුම් වාසි දක්වන්න. (ලකුණු 04)

(03) (i) එළවළු සහ පළතුරු ආහාරයට ගැනීමේ ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) ආහාර සකස් කිරීමේ දී, පිළියෙල කිරීමේ ක්‍රියාවලියට අදාළ පියවර ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) වෙළෙඳපොළෙන් ආහාර තෝරා ගැනීමේ දී, පාරිභෝගිකයාට මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(04) (i) ආහාර ජීර්ණ ක්‍රියාවලියේ දී අවශ්‍යවන, ජීර්ණ යුෂ ස්‍රාවය කරන ඉන්ද්‍රියයන් තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) මහා පෝෂක සඳහන් කර, ඒවා ජීර්ණයෙහි අවසාන ඵල, ඒ ඉදිරියෙන් දක්වන්න. (ලකුණු 03)

(iii) (අ) ආහාර පිළිගැන්වීමේ දී සංග්‍රාහකයා විසින් අනුගමනය කළ යුතු කරුණු දෙකක් ලියන්න.

(ආ) පහත සඳහන් ක්‍රියාවලි කෙටියෙන් විස්තර කරන්න.

- බාහිර ආස්‍රැති ක්‍රියාවලිය
- විසරණය (ලකුණු 04)

(05) (i) වර්ණ අගමානයක් යනු කුමක්දැයි සඳහන් කර, රතු වර්ණය සඳහා වර්ණ අගමානයක් සකස් කර ගන්නා අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ගෙවත්තේ පාංශු සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) නිවසින් බැහැර කරන අපවිත්‍ර ජලය ප්‍රයෝජනයට ගත හැකි ආකාරය පිළිබඳව කරුණු දෙකක් ඇසුරින් පහදන්න. (ලකුණු 04)

(06) (i) ''ප්‍රාථමික ලිංගික ලක්ෂණ'' පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) යෞවනයාගේ මානසික වර්ධනය, බාහිරව පෙන්නුම් කරන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ගර්භණී මවක් අයඩින් ඌනතාවයට ගොදුරු වීමෙන් ඇති විය හැකි සංකූලතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(07) (i) ළමා සංවර්ධනයට බලපාන්නා වූ වැදගත් සාධක හතර නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට අනුව, පහත සඳහන් එන්නත් ලබා දෙන්නේ කුමන වයස් සීමාවන්හි දී දැයි සඳහන් කරන්න.

- ජැපනීස් එන්සෙෆලයිටීස්
- ත්‍රිත්ව එන්නත සිව්වන මාත්‍රාව
- ATD එන්නත (ලකුණු 03)

(iii) යොවුන් වියේ දරුවකුගේ සමාජ වර්ධනය පිළිඹිබු කරන ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

SLGURU.LK

For Educational Purpose Only

“Tell me and I forget. Teach me and I remember. Involve me and I learn.” — Benjamin Franklin



Visit SLGURU.LK to download papers and notes.